# සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුවසහන අරමුදල

# විශ්‍රාම සාමාජික විස්තර වාර්තාව

(විශ්‍රාමික/විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා පමණි)

<u>අරමුණ</u>

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්/විශ්‍රාමික සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා සෞඛ්‍යය ආවරණයක් හා ජීවිත ආවරණයක් ලබාදීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්/විශ්‍රාමික සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය පහසුකම් රජයේ සහ පුද්ගලික රෝහල්වලින් ලබාගැනීමේදී දැරීමට සිදුවන වියදම් ප්‍රතිපූරණය කිරීම.
- යුද්ධ හමුදා සාමාජිකයෙකු/ විශ්‍රාමික සාමාජිකයෙකු, කලත්‍රයා හා දරුවෙකු ගේ ජීවිත අහිමි වීමකදී ජීවිතාවරණය යටතේ මුදල් හිමිගැන්වීම.
- දරු උපතකදී ප්‍රතිලාභ මුදලක් ලබාදීම.
- යුද්ධ හමුදා සාමාජිකයෙකු/විශ්‍රාමික සාමාජිකයෙකු හදිසි අනතුරක් හේතුවෙන් ඇතිවන ආබාධිත තත්වයකදී අබාධිත ප්‍රතිශතය අනුව වන්දි මුදල් හිමිගැන්වීම.
- සාමාජිකයින්ගේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වන විශේෂිත වූ ප්‍රතිකාර සඳහා මුදල් ප්‍රතිපූරණය කිරීම.
- සාමාජිකයාගේ දරුවන් සඳහා පමණක් මුඛ හා දන්ත ආශ්‍රිත ප්‍රතිකාර සඳහා ප්‍රතිලාභ මුදල් හිමිගැන්වීම.
- යුද්ධ හමුදා/රජයේ රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා අවස්ථාවකදී ගමන් වියදම් දීමනාවක් ලබාදීම.
- යුද්ධ හමුදා සාමාජිකයා සඳහා පමණක් ඇස් කණ්නාඩි දීමනාවක් හිමිගැන්වීම.
- යුද්ධ හමුදා සාමාජිකයකු/විශ්‍රාමික සාමාජිකයකු, කලත්‍රයා සහ දරුවෙකු මියයාමෙන් හෝ ආබාධිත තත්වයට පත්වීමෙන් ඇතිවන මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරාලීම.
- ඉහත විස්තර කළ සාමාජිකයන් සක්‍රිය සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු සාමාජිකත්වය ස්වකීය කැමැත්ත මත ඉදිරියටත් පවත්වාගෙන යා හැකි අතර, එසේ හැකි වනුයේ මෙම අරමුදල ආරම්භ කිරීමෙන් පසු <u>(ආරම්භක දිනය 2014.01.02)</u> <u>එක් වාරිකයක් හෝ අයවී ඇති</u> විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම ගන්නා සාමාජිකයින් සඳහා පමණි.
- සාමාජිකයා මියගිය අවස්ථාවේදී සම්පූර්ණ හිමිකම් මුදල වන රු: 1000000.00ක මුදල ලබා ගැනීමෙන් පසු සුවසහන අරමුදලේ සාමාජිකත්වය පවත්නා ව්‍යවස්ථාවට අනුව අහෝසි වන අතර, **කලත්‍රයාගේ කැමැත්ත මත සාමාජික මියයාම වෙනුවෙන් හිමි** ප්‍රතිලාභ මුදලින් රු: 500,000.00 ක් (එනම් අඩක් පමණක්) ලබාගෙන ඉතිරි රු: 500,000.00 ක මුදල සුවසහන අරමුදලේ රඳවා තබා එම මුදලින් ඉදිරි සාමාජික මුදල් වාරිකයන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර, ඒ අනුව මාසික වාරික මුදල් ගෙවීමකින් තොරව සක්‍රීයව හා අඛණ්ඩව සුවසහන අරමුදලේ සාමාජිකත්වය වයස අවු: 80 දක්වා පවත්වාගෙන යාමට කලත්‍රයාට අවස්ථාව හිමිවේ.
- සාමාජිකයකුට වයස අවුරුදු 80 වන තෙක් පමණක් මෙම අරමුදලෙහි සාමාජිකත්වය ලබාගත හැකි අතර, සාමාජිකයා මියයාමෙන් පසු කලත්‍රයා ගේ වයස අවුරුදු 80 දක්වා අරමුදලේ සාමාජිකත්වය ඉදිරියට පවත්වාගෙන යාමට හැක.
- යුද්ධ හමුදාවට අනුයුක්ත ස්ථිර සහ අනියම් සිවිල් සේවක මහත්ම/මහත්මීන් සඳහා මෙම අරමුදලේ සාමාජිකත්වය ලබාගත නොහැක.

<u>වාරික අයකර ගැනීමේ ක්‍රමවේදය</u>

- දැනට සක්‍රිය සේවයේ නියුතු අයවළුන්ගේ මාසික වාරික මුදල වැහාලේඅම වෙතින් ඉඳුරාම මාසික වැහාදී වලින් අයකර රෙජිමේන්තු වශයෙන් වෙන් වෙන්ව නාමලේඛණ සමග සුවසහන අරමුදල වෙත ඉදිරිපත් කරනු ලැබේ.
- විශ්‍රාම සාමාජිකයින් ඔවුන් හට ලබාදී ඇති පුද්ගලික ගිණුම් අංකය වෙත වාරික මුදල් (වාර්ෂිකව/අර්ධ වාර්ෂිකව) බැර කිරීමට කටයුතු සිදුකල යුතුය.

**<u>ප්‍රතිලාභීන්</u>**

❖ **<u>සාමාජික මුදල</u>**

මාසික වාරිකය - රු. 700.00 (අවස්ථානුකූලව සංශෝධනය විය හැක)

❖ **<u>සාමාජිකයා විවාහක නම්</u>**

- සාමාජිකයා : වයස අවුරුදු 80 වන තෙක් පමණක්.
- කලත්‍රයා : වයස අවුරුදු 80 වන තෙක් පමණක්.
- දරුවන් : අවිවාහක, රැකියා විරහිත වයස අවුරුදු 30 ට අඩු නීත්‍යානුකූල යුද්ධ හමුදාව පිළිගත් දරුවන් සඳහා පමණක් (විශේෂ අවශ්‍යතා ඇති ඉපයීමේ හැකියාවක් නොමැති දූ දරුවන්ට වයස් සීමාව බලනොපානු ඇත) හිමිකම් ඇත.

❖ **<u>සාමාජිකයා අවිවාහක නම්</u>**

- සාමාජිකයා : වයස අවුරුදු 80 වන තෙක් පමණක්.
- සාමාජිකයාගේ මව : වයස් සීමාවක් නොමැත
- සාමාජිකයාගේ පියා : වයස් සීමාවක් නොමැත

(මව/පියාගේ මරණ සඳහා හිමිකම් නොමැත)

❖ කිසියම් සාමාජිකයකු හට භාර්යාව, දූදරුවන්, මව, පියා ජීවතුන් අතර නොමැති නම් පමණක් ප්‍රතිලාභියකු ලෙස වෙනත් අයෙකු භාරකරු ලෙස නම් කළ හැකිය. එකී භාරකාරත්වය සනාථ කිරීම සඳහා නීතිමය වශයෙන් පිළිගත හැකි ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලියකියවිලි රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතුය.

**<u>ප්‍රතිලාභ ලබාගත නොහැකි අවස්ථා</u>**

❖ වෛසේඅම වෙතින් අනුමත නොකරනු ලබන රෝග සඳහා කරනු ලබන ප්‍රතිකාර
❖ නීත්‍යානුකූල නොවන ගබ්සා කිරීම් හෝ ඉන් ඇතිවන අතුරු ආබාධ සඳහා කරනු ලබන ප්‍රතිකාර
❖ පවුල් සැළසුම් සැත්කම් සහ ප්‍රතිකාරයන් සඳහා.
❖ අනිවාර්ය එන්නත් කිරීම්.
❖ පංචකර්ම, රූපලාවන්‍ය හා සම්බාහන ප්‍රතිකාර.
❖ රූපලාවන්‍ය කටයුතු සඳහා සිදුකරන සැත්කම් හා ප්‍රතිකාර සඳහා.
❖ වාර්ෂික වෛද්‍ය පරීක්ෂණ සහ රෝගී තත්වයක් නොමැතිව සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ සඳහා (නිරන්තර වෛද්‍ය පරීක්ෂණ).

**<u>ප්‍රතිලාභ ගෙවීම</u>**

❖ සියලුම ප්‍රතිලාභ සඳහා ගෙවීම් ප්‍රේෂණපත් මගින් ප්‍රතිලාභියාගේ බැංකු ගිණුම වෙත බැරකරනු ලබයි.

## සුවසහන අරමුදල වෙතින් ලබාදෙනු ලබන ප්‍රතිලාභ විස්තරය

| ප්‍රතිලාභ | | මුදල රු. |
|---|---|---|
| **සාමාජිකයා** | | |
| සාමාජික වයස් සීමාව | | අවු: **80** දක්වා |
| සාමාජික මරණ සඳහා | | **1,000,000.00** |
| හදිසි අනතුරු (ආබාධිත ප්‍රතිශතය අනුව 100% ) | | **1,000,000.00** |
| **බරපතල රෝග ආවරණය** (ශල්‍යකර්ම, රෝහල්ගත නොවී බාහිරින් මිලදී ගන්නා ඖෂධ, ශල්‍ය උපකරණ, වෛද්‍ය පරීක්ෂණ, වෛද්‍ය හමු (Channeling) හා ඔසුසල් (Pharmacy) බිල්පත් ඇතුළත්ව) | | **1,500,000.00** |
| ඇස්කණ්නාඩි දීමනාව (වසර 3 කට වරක් රු:20,000.00 ක් හිමිගන්වනු ලබන අතර වසර 3 කට අඩුකාලයකදී උපැස් යුවලේ අළුත්වැඩියා කටයුතු සඳහා එක් වරක් පමණක් රු:10,000.00 ක් හිමිගන්වනු ලැබේ) | | **20,000.00** |
| **කාලත්‍රයා** | | |
| **වයස් සීමාව** | | **අවු: 80 දක්වා** |
| මරණ | | **500,000.00** |
| බරපතල රෝග ආවරණය | | **1,500,000.00** |
| **දරුවන් අවිවාහක, රැකියා විරහිත** | | |
| **වයස් සීමාව (විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වයස් සීමාවේ බලපෑමක් නොමැත)** | | අවු: **30** දක්වා |
| දරු උපත් සඳහා - 2024.01.01 දිනෙන් පසුව උපදින දරුවන් සඳහා (2024.01.01 දිනට පෙර ඉපදුන දරුවන් සඳහා රු:10,000.00) | | **25,000.00** |
| මරණ | අවුරුදු 01 ට වැඩි දරුවන් සඳහා | **100,000.00** |
| | අවුරුදු 01 ට අඩු දරුවන් සඳහා | **50,000.00** |
| **බරපතල රෝග ආවරණය** | | **1,500,000.00** |
| **වයස අවු: 22 ට අඩු දරුවන්ගේ හදිසි අනතුරකදී ඇතිවන ආබාධිත තත්වයකදී වෛද්‍යවරයා වෙතින් නිර්දේශිත ආබාධිත ප්‍රතිශතය අනුව 100%** | | **1,000,000.00** |
| **මුඛ හා දන්ත ආශ්‍රිත ප්‍රතිකාර ආවරණය (දරුවන් සඳහා පමණයි)** | | |
| **සාමාජිකයා/පවුලේ සාමාජිකයින් හට හදිසි අනතුරු තත්වයකදී මුඛ ආශ්‍රිත ශල්‍යකර්ම සඳහා පමණක් දන්තවෛද්‍යවරයා සහ වෛද්‍යවරයා නිර්දේශය මත සාමාන්‍ය රෝග කාණ්ඩය යටතේ වාර්ෂිකව හිමි රු.200,000.00 ක මුදල හා බරපතල නොවන ශල්‍යකර්ම කාණ්ඩය යටතේ වාර්ෂිකව හිමි රු.300,000.00 ක මුදල සමග රු:500,000.00 ක මුදලකට යටත්ව ප්‍රතිලාභ ලබාදීම.** | | **500,000.00** |
| **විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා** | | |
| **කථන/සංඥා පුහුණුව හා මනෝ චිකිත්සාව වැනි විශේෂ ප්‍රතිකාර සඳහා** සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි මුදලින් හිමිගන්වනු ලැබේ | | **200,000.00** |
| **පවුල් ඒකකයක් සඳහා වසරකට (අදාල වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා) සෞඛ්‍ය සහ රෝහල් ප්‍රතිලාභ (අවිවාහක අයවළුන්ගේ දෙමාපියන්ද ඇතුළුව)** | | |
| රෝහල්ගත කිරීම් - සාමාන්‍ය (රජයේ ලියාපදිංචි පුද්ගලික රෝහල්, ආයුර්වේද රෝහල්, ඇස්කන්නාඩි, ගමන් වියදම් උපරිම දින 10 x 1000.00 = 10,000.00 හා රෝග පරීක්ෂණ 419 ඇතුලත්ව) | | **200,000.00** |

| | |
|---|---|
| රෝහල්ගත කිරීම් - සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි මුදලින් හිමිගන්වනු ලැබේ. (හදිසි අනතුරු තත්ත්වයකදී හෝ බරපතළ රෝගාබාධ තත්වයකදී සිදුවන ඔත්පලවීමක් හේතුවෙන් නිවෙස්ගතව ප්‍රතිකාර ලබාගැනීමේදී අධිපෝෂිත ආහාර වට්ටෝරු, අධිපෝෂිත පිටි වර්ග හා පුද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය, ඖෂධ, සැරහුම් හා වෙනත් වෛද්‍ය උපකරණ බාහිරින් මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභ හිමිකම)<br>**වයස අවු 1½ දක්වා දරුවන් හට වෛද්‍ය වරයාගේ නිර්දේශ මත පෝෂණ අවශ්‍යතා සඳහා මිලදී ගන්නා බාහිර මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රතිලාභ හිමිකම.** | **200,000.00** |
| **රෝහල්ගත කිරීම් - බරපතල නොවන සැත්කම් (අදාල වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා) (අවිවාහක අයවළුන්ගේ දෙමාපියන්ද ඇතුළුව)** | **300,000.00** |
| **අවිවාහක අයවළුන්ගේ දෙමාපියන් සඳහා බරපතල රෝග ආවරණය (ජීවිත කාලයටම)** | |
| මව | **1,500,000.00** |
| පියා | **1,500,000.00** |

**සටහන:**

- බරපතල රෝග වෙනුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමේදී ඒ සඳහා හිමිකම් ඇති **රු.1,500,000.00 (රුපියල් මිලියන 1.5) ක මුදල ප්‍රමාණවත් නොවන්නේ නම් සාමාන්‍ය රෝහල්ගත කිරීම් යටතේ පවුල් ඒකකයක් සඳහා වාර්ෂිකව හිමි රු. 200,000.00 ක මුදල සහ බරපතල නොවන ශල්‍යකර්ම යටතේ පවුල් ඒකකයක් වෙනුවෙන් වාර්ෂිකව හිමි රු. 300,000.00 ක ප්‍රතිලාභ මුදල් එම වසර තුල ලබා ගෙන නොමැතිනම් එම මුදල සමඟ රු. 2,000,000.00 (රුපියල් මිලියන 2)** ක මුදලක් ලබාගැනීමට හැකියාව ඇත.
- බරපතළ රෝග කාණ්ඩය යටතේ ප්‍රතිලාභ හිමිගන්වන බරපතළ රෝග සංඛ්‍යාව **49 ක්** වන අතර මීට අමතරව වෛද්‍යම වෙතින් පත්කරන විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් විසින් බරපතළ රෝගයක් බවට තීරණය කරන රෝග සඳහාද බරපතළ රෝග කාණ්ඩය යටතේ බිල්පත් ප්‍රතිපූරණය සිදු කරනු ලබයි.
- **පහත සඳහන් ලිපිලේඛණයන්හී සිවිල් තත්වයේ වෙනසක් නොමැතිනම් එක් වරක් පමණක් සුවසහන අරමුදල වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.**
  - විශ්‍රාම සාමාජික අයදුම්පත
  - විශ්‍රාම සංශෝධිත අයදුම්පත්‍රය (සිවිල් තත්වයේ වෙනසක් ඇත්නම් පමණයි)
  - ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද උප්පැන්න සහතිකය (දරුවන් සඳහා පමණයි)
  - ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද විවාහ සහතිකය (කාලත්‍රයා සඳහා පමණයි)
  - ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
  - විශ්‍රාම හැඳුනුම්පතෙහි ඡායා පිටපත
  - දරු උපත්, ගමන් දීමනා සහ ඇස්කණ්නාඩි සඳහා මුද්දර ගාස්තු අවශ්‍ය නොවේ

**ප්‍රතිලාභ ගෙවීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛණ**

- **විශ්‍රාම සාමාජිකයින් ප්‍රතිලාභ ලබා ගැනීමට අදාල ලිපි ලේඛණ යුද්ධ හමුදා මූලස්ථානයේ සුභසාධක** අධ්‍යක්ෂ මණ්ඩලයේ සුවසහන විශ්‍රාම අංශය වෙත ඉදුරාම භාරදිය යුතුයි. ( ඒකක/රෙජිමේන්තු වලින් තොරව)

**සාමාජිකයා මියයාමකදී**

- විශ්‍රාම සාමාජික අයදුම්පත.
- විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ප්‍රා: ලේ සහතික කරන ලද මරණ සහතිකයේ මුල් පිටපත.
- ප්‍රා: ලේ සහතික කරන ලද උප්පැන්න සහතිකයේ මුල් පිටපත. (දරුවන් විසින් ප්‍රතිලාභ ඉල්ලුම් කරන්නේනම් පමණයි)
- ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ පිටපත. (කාලත්‍රයා විසින් ප්‍රතිලාභ ඉල්ලුම් කරන්නේ නම් පමණයි)
- ප්‍රතිලාභ ඉල්ලුම් කරන අයගේ බැංකු පාස්පොතේ පිටපත.
- ප්‍රතිලාභ ඉල්ලුම් කරන අයගේ හැඳුනුම්පතේ පිටපත.
- අවිවාහක සාමාජිකයෙකු නම් මව හෝ පියා වෙත ප්‍රතිලාභ ලබාදීමට මව හෝ පියාගෙන් ලබාගන්නා ලද කැමත්ත ප්‍රකාශිත ලිපිය.

**කලත්‍රයා මියයාමකදී**

- විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය
- ප්‍රා:ලේ සහතික කරන ලද මරණ සහතිකයේ මුල් පිටපත.
- ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ මුල් පිටපත.
- විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.
- ජාතික හැඳුනුම්පතේ පිටපත.
- බැංකු පාස්පොතේ පිටපත.

**හදිසි අනතුරු ( ආබාධිත ප්‍රතිශතය අනුව 100% )**

- විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය
- හදිසි අනතුරු රෝග නිශ්වය වාර්ථාව වෛද්‍ය/මණ්ඩල වාර්ථාවේ මුල් පිටපත.
- යුද්ධ හමුදා වෛද්‍ය මණ්ඩල වාර්ථාවෙහි පිටපතක්.
- විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.
- ජාතික හැඳුනුම්පතේ පිටපත.

- ❖ බැංකු පාස්පොතේ පිටපත.

<u>**දරු උපතකදී**</u>

- ❖ විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල්පිටපත.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ මුල් පිටපත.
- ❖ විශ්‍රාම සංශෝධිත සාමාජික අයදුම්පත.
- ❖ ජාතික හැඳුනුම්පතේ පිටපත.
- ❖ විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.
- ❖ බැංකු පාස්පොතේ පිටපත.

<u>**සාමාන්‍ය රෝහල්ගත කිරීම්, ආයුර්වේද, ශල්‍යකර්ම හා බරපතල රෝගාබාධ සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛණ**</u>

- ❖ විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ❖ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව. (Doctor prescription)
- ❖ රෝග නිශ්චය කාඩ්පත. (Diagnosis Card)
- ❖ අවසන් බිල්පතට අදාල මුදල් ගෙවීම් ලදුපත් (Original Receipt).
- ❖ අවසන් මුල් බිල්පත (Original Bill/ Detail Bill).
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද උප්පැන්න සහතිකයේ මුල් පිටපත(දරුවන් සඳහා ඉල්ලුම් කරන්නේ නම් දරුවාගේ/අවිවාහක සාමාජිකයින් දෙමාපියන් සඳහා ඉල්ලුම් කරන්නේ නම් සාමාජිකයාගේ).
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ මුල් පිටපත (කලත්‍රයා සඳහා ඉල්ලුම් කරන්නේ නම්).
- ❖ බැංකු පාස්පොතේ පිටපත.
- ❖ ජාතික හැඳුනුම්පතේ පිටපත.
- ❖ විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.

<u>**ඇස් කණ්නාඩි මිලදී ගැනීම**</u>

- ❖ විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ❖ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව.
- ❖ මුදල් ගෙවන ලද මුල් බිල්පත/ ලදුපත (Original Bill/ Receipt).
- ❖ ජාතික හැඳුනුම්පතේ පිටපත.
- ❖ බැංකු පාස් පොතේ පිටපත.
- ❖ විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.

<u>**ගමන් වියදම් දීමනා ලබාගැනීම**</u>

- ❖ විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද උප්පැන්න සහතිකයේ මුල් පිටපත (දරුවන් සඳහා ඉල්ලුම් කරන්නේ නම් දරුවාගේ/අවිවාහක සාමාජිකයින් දෙමාපියන් සඳහා ඉල්ලුම් කරන්නේ නම් සාමාජිකයාගේ).
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ මුල් පිටපත (කලත්‍රයා සඳහා ඉල්ලුම් කරන්නේනම්).
- ❖ රෝග නිශ්චය කාඩ්පත හෝ පිටත්කර හැරීමේ තුණ්ඩුව (මුල් පිටපත).
- ❖ විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.
- ❖ ජාතික හැඳුනුම්පතේ පිටපත.
- ❖ බැංකු පාස්පොතේ පිටපත

<u>**දරුවෙකු මියයාමකදී**</u>


- ❖ විශ්‍රාම ප්‍රතිලාභ අයදුම්පත්‍රය.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද මරණ සහතිකයේ මුල් පිටපත.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද විවාහ සහතිකයේ මුල් පිටපත.
- ❖ ප්‍රා:ලේ සහතික කරන ලද උප්පැන්න සහතිකයේ මුල් පිටපත.
- ❖ ජාතික හැඳුනුම්පතේ පිටපත.
- ❖ විශ්‍රාම හැඳුනුම්පතේ පිටපත.

- ❖ බැංකු පාස්පොතේ පිටපත.

**<u>සුවසහන අරමුදලේ විශ්‍රාමික සාමාජිකයින් සාමාජික මුදල් තැන්පත් කිරීම පිළිබඳ විස්තරය</u>**

1. විශ්‍රාමික සාමාජිකයින් වාර්ෂිකව **රු:8400.00** හෝ අර්ධ වාර්ෂිකව (මාස 06ක් සඳහා) **රු:4200.00** ක් සාමාජික මුදල් එකවර තැන්පත් කළ යුතුය.
2. සාමාජික මුදල් තැන්පත් කළ යුතු ගිණුම් අංකය සෑම සාමාජිකයෙකුටම වෙන්වූ අංක 10 කින් යුත් ඒ ඒ **සාමාජිකයා සඳහා පමණක් ආවේණික අංකයක්** වන අතර, තමාට හිමි සුවසහන ගිණුම් අංකය සුවසහන අරමුදල වෙතින් ලබා ගත හැක.
3. ගිණුමේ නම - යුද්ධ හමුදා සුවසහන අරමුදල
4. ඕනෑම මහජන බැංකු ශාඛාවක් වෙතින් සුවසහන අරමුදලට සාමාජික මුදල් තැන්පත් කිරීමේ හැකියාව ඇත.
5. ඔබ විසින් සාමාජික මුදල් තැන්පත් කරනු ලබන ගිණුම මහජන බැංකුව සහ සුවසහන අරමුදල වෙතින් පවත්වාගෙන යනු ලබන Cooperate Account ගිණුම් ක්‍රමයක් වන අතර, මහජන බැංකු ජාලය තුල මෙම ගිණුම හඳුනාගනු ලබන්නේ **<u>Army Collection 50</u>** යනුවෙනි.
6. විශ්‍රාම සාමාජිකයින් සාමාජික මුදල් තැන්පත් කිරීමෙන් පසු පැය 24ක් ඇතුලත සුවසහන අරමුදල වෙත ලබාදී ඇති දුරකථන අංකය වෙත කෙටි පිණිවිඩයක් (SMS) යොමු කිරීමට කටයුතු කරනු ලබන අතර, ලිපිගොණු යාවත්කාලීන කිරීමෙන් පසු මුදල් තැන්පතු ලදුපත ලබාදී ඇති ලිපිනය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
7. සුවසහන අරමුදල වෙත ඔබ විසින් ලබාදී ඇති දුරකථන අංකය හා ලිපිනය වෙනස් වන්නේ නම් ඉතා කඩිනමින් සුවසහන අරමුදල දැනුවත් කිරීමට කාරුණික වන්න.
8. නව තාක්‍ෂණික ක්‍රමවේදයන් යටතේ සුවසහන අරමුදලේ කටයුතු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බැවින් ඔබගේ පුද්ගලික දුරකථන අංකය, Whatsapp අංකය හා පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය (Email) සුවසහන අරමුදල වෙත ලබාදීමට කාරුණික වන්න.

**සාමාජිකයාට අවේනික ගිණුම් අංකය**



PEOPLE'S BANK
මහජන බැංකුව | மக்கள் வங்கி

තැන්පතු පත | வைப்புச்சீட்டு | Deposit Slip    Office Copy

ගිණුම් අංකය கணக்கு இலக்கம் Account Number: 1 0 0 x x x x x x x

දිනය | திகதி | Date: 0 5 0 9 2 0 2 3

UG/10/20/02

ගිණුම් හිමියාගේ නම / கணக்குரிமையாளரின் பெயர் / Name of Account Holder: යුද්ධ හමුදා සුවසහන අරමුදල

ගිණුම් හිමියා හැර වෙනත් අයෙකු විසින් කරනු ලබන රු. 200,000/- ට වැඩි තැන්පතු සඳහා පමණක් පහත විස්තර සම්පූර්ණ කරන්න.
கணக்குரிமையாளரைத் தவிர ஏனையவர்களினால் ரூ.200,000/- க்கு அதிகமாக செய்யப்படும் வைப்புக்களுக்காக மாத்திரம் பின்வரும் விபரங்களை பூர்த்தி செய்யவும்.
Give the following information only when a deposit of over Rs. 200,000/- is made by a person other than the Account Holder.

නම / பெயர் / Name: රෙජි අංකය නිලය නම

ලිපිනය / முகவரி / Address:    දුරකථන අංකය / தொலைபேசி இல. / Tel. No.: 071XXXXXXX

ජා.හැ.ප. | විදේශ ගමන් බලපත් | රියදුරු බලපත් අංකය / தே.அ.அ./கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல. NIC/ P.P./ D.L. No.

හේතුව / காரணம் / Purpose: සාමාජික මුදල් තැන්පත් කිරීම සඳහා

මුදල් තැන්පත්කරන්නාගේ අත්සන / பண வைப்பாளரின் கையொப்பம் / Cash Depositor's Signature

| නෝට්ටු / தாள்கள் / Notes | රුපියල් / ரூபா / Rs. | ශත. / சதம். / Cts. |
|---|---|---|
| x 5000 | 8400 | 00 |
| x 2000 | | |
| x 1000 | | |
| x 500 | | |
| x 200 | | |
| x 100 | | |
| x 50 | | |
| x 20 | | |
| x 10 | | |
| කාසි / நாணயங்கள் / Coins | | |
| එකතුව / மொத்தம் / Total | 8400 | 00 |

යන්ත්‍ර මුද්‍රාව හෝ නිල අත්සන ඇත්නම් වලංගුයි | இயந்திர பதிவு அல்லது உத்தியோகபூர்வ கையொப்பத்துடன் செல்லுபடியாகும் | Valid if Overprinted or Signed by an Officer

මෙම ඉරට පහලින් කිසිවක් නොලියන්න | இக் கோட்டுக்குக் கீழே எதுவும் எழுத வேண்டாம் | Do Not Write Anything Below This Line

Form No 213 DP

Checked by

## සුවසහන අරමුදලේ විශ්‍රාමික සාමාජිකත්වය පවත්වාගෙන යාමේදී සැලකිය යුතු ව්‍යවස්ථානුකූල කරුණු

- යුද්ධ හමුදා සාමාජිකයෙකු විශ්‍රාම යාමෙන් පසු සුවසහන අරමුදලේ විශ්‍රාමික සාමාජිකත්වය ලබා ගන්නා කාලසීමාවේදී යුද්ධ හමුදා සාමාජිකයාගේ වැටුපෙන් සුවසහන අරමුදල වෙත මාසික වාරික මුදල බැරවීම අවසන් වු මස සිට (අවසන් වැටුප් පත්‍රිකාව අනුව) ඉදිරියට විශ්‍රාම සාමාජිකත්වය ලබා ගැනීම සදහා **මාස 06 ක සහන කාලසීමාවක් ලබා දී ඇත.** ලබා දී ඇති සහන කාලසීමාව ඉක්මවා ගොස් විශ්‍රාමික සාමාජිකයෙකු සාමාජිකත්වය ලබා ගැනීමකදී සාමාජිකත්වය අක්‍රිය වු මස සිට සාමාජිකත්වය ලබා ගන්නා අවස්ථාව දක්වා **මසකට රු: 100.00 බැගින් ප්‍රමාද ගාස්තුවක්** අයකරනු ලබන අතර, එම ප්‍රමාද ගාස්තුව හා අදාළ කාලසීමාවට අයත් සාමාජික මුදල එකවර සුවසහන අරමුදලට තැම්පත් කල යුතුය.
- විශ්‍රාම යාමේදී සාමාජිකත්වය අක්‍රිය වූ අවස්ථාවකදී මසකට **රු 100.00 බැගින් ප්‍රමාද ගාස්තුවක් ගෙවා උපරිම අවස්ථා 03 ක දී පමණක්** සාමාජිකත්වය ලබා ගත හැක. එසේ සාමාජිකත්වය සක්‍රීය කර ගැනීමෙන් පසු **පළමුවන අවස්ථාව සඳහා මාස 03 ක පරිවාස කාලයකින්** පසුව සිදුවන සිදුවීම් සඳහා පමණක් හිමිකම් ඇති අතර, **දෙවන අවස්ථාව සඳහා මාස 06 ක පරිවාස කාලයකින් පසුව සහ තෙවන අවස්ථා සඳහා මාස 12 ක පරිවාස කාලසීමාවකින් පසුව සිදුවන සිදුවීම් සඳහා පමණක් හිමිකම් ඇත**.
- විශ්‍රාම සාමාජිකයෙකු සාමාජික මුදල් තැම්පත් කිරීමේදී වර්ෂයක් (මසකට රු: 700.00 බැගින්) සඳහා රු: 8400.00 ක් හෝ අඩවසරක් සඳහා රු: 4200.00 ක මුදලක් එකවර තැම්පත් කල යුතු අතර, **අදාල සාමාජිකයාට හිමි පුද්ගලික සුවසහන ගිණුම් අංකය සුවසහන අරමුදල සමග සම්බන්ධතාවයෙන් ලබාගත හැකිය**. (2021 ජුනි මස සිට ඉදිරියට වැහාලේඅම වෙතින් විශ්‍රාම ගන්වනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ අවසන් වැටුපෙන් සුවසහන අරමුදල වෙත සාමාජික මුදල් බැරවීමක් සිදු නොවේ).
- වාර්ෂිකව මුදල් තැන්පත් කරන අයවළුන් සඳහා දින 42ක් හා අර්ධ වාර්ෂිකව (මාස 06) ක් සඳහා මුදල් තැන්පත් කරන අයවළුන් හට දින 21ක සහන කාල සීමාවක් හිමිවේ.
- වයස අවුරුදු 80 වනතෙක් පමණක් සාමාජිකයෙකුට මෙම අරමුදලේ රැඳී සිටිය හැකි අතර, වයස අවුරුදු 80 දී කල්පිරීම සිදුවනු ඇත. සාමාජිකයාගේ කැමැත්ත පරිදි කල්පිරීමේ හිමිකම වයස අවුරුදු 65 දී ලබාගත හැකිය.
- යම් ප්‍රතිලාභ මුදලක් ලබාගෙන ඇත්නම් එම ලබාගෙන ඇති ප්‍රතිලාභ මුදල ගෙවා ඇති වාරික මුදලට වඩා අඩුවේ නම් පමණක් එහි වෙනස කල්පිරීමේදී නැවත ලබා ගැනීමට සාමාජිකයාට හිමිකම් ඇත. ගෙවා ඇති මුලු වාරික මුදලට වඩා වැඩිපුර ප්‍රතිලාභ ලබාගෙන ඇත්නම් කල්පිරීමේදී කිසිදු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## විශ්‍රාම ගැන්වීමේදී සුවසහන අරමුදල දැනුවත් කිරීම් සිදුකරන අවස්ථා

- යුද්ධ හමුදා සාමාජිකයින් විශ්‍රාම යාමෙන් පසුවද සුවසහන අරමුදලේ විශ්‍රාම සාමාජිකත්වය පවත්වාගෙන යාමට කැමති සාමාජිකයින් සදහා විශ්‍රාමික සාමාජික අයදුම් පත්‍ර සම්පූර්ණ කර මෙම අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් සියලුම රෙජිමේනතු මධ්‍යස්ථාන දැනුවත් කර ඇත.
- විශ්‍රාම ගැන්වීමේදී සුභසාධක අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් අවසන් නිශ්කාෂණ සහතිකය ලබා ගන්නා අවස්ථාවේදී සුවසහන අරමුදලේ සාමාජිකත්වය පවත්වාගෙන යාම පිළිබදව **කැමති/අකමැති** භාවය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී ඇත.

### දුරකථන අංක - සුවසහන අරමුදල

**Tel** : **මාණි 1 (සුවසහන)** - 0112514078/0766907328

: **මාණි 11 (විශ්‍රාම අංශය) –** 0772916934

**Whatsapp:** 0761465154

**Hot Line :** 0114050885, 0114050879, 0114050232, 0114050882, 0713158572, 0702691666, 0703158510

**Email :** suwasahanafund@army.lk

**Gmail :** ssfpensionsec@gmail.com